**නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රුඩ් 01 පර්චස් 24.5ක් වූ කොක්වලමුල්ල එඩ්මන් පීරිස් ඉඩමේ වටිනාකම රු.90,000ක් ද රුඩ් 02 පර්චස් 19.8ක් වූ කීනකැලේ ලොට් 5සී ඉඩමේ රු.2,700,000ක් ද අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශ මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජ’නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නිම කළ කටුනේරිය පුස්තකාල ගොඩනැගිල්ලේ වටිනාකම රු.5,081,338ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | රු.1,718,431ක වටිනාකමින් යුතු නාත්තණ්ඩිය සතිපොළෙහි මායිම් තාප්පය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වායු සමීකරණය සඳහා දැරූ වියදම රු.558,934ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම. | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මු.රෙ. 104(4) | හදිසි අනතුරකට ලක් වූ සභාවේ කැබ් රථයේ අලාභය පිළිබඳ පූර්ණ වාර්තාවක් මාස 03ක් ඇතුළත ඉදිරිපත් කර නොතිබුණි. | විමර්ශන වාර්තාව ලැබූ විගස මුරෙ (104) (04) අනුව පූර්ණ වාර්තාව ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.186,267,559ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.153,111,736ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 24,587 | 28,226 | 21,226 | 24,389 | 18,043 | 18,155 | 12,869 | 22,584 |
| කුලී | 29,513 | 24,956 | 22,920 | 4,159 | 29,422 | 19,964 | 17,134 | 4,395 |
| බලපත්‍ර ගාස්තු | 5,693 | 3,257 | 3,254 | 3,000 | 5,741 | 5,583 | 5,583 | 7 |
| වෙනත් ආදායම් | 33,751 | 50,490 | 50,026 | 1,006 | 203,425 | 203,120 | 1,658 | 333,983 |
| එකතුව | 93,544 | 106,929 | 97,426 | 32,554 | 256,631 | 246,822 | 37,244 | 360,969 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.23,623,184ක්, හිඟ අක්කර බදු රු.756,967ක්, හිඟ කඩකුලී ආදායම රු.1,581,865ක් සහ හිඟ බදු කුලී රු.2,176,803ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපළ තහනම් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ හිඟ කඩ කුලී නොගෙවන ලද කඩ හිමියන්ගේ ගිවිසුම් අවලංගු කිරීමට කටයුතු කරන බව. | හිඟ හිටි ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවතු වගා සංග්‍රාමය සඳහා බීජ කට්ටල 4000 ක් ලබා ගැනීම වෙනුවෙන් රු.400,000 ක් වියදමක් දරා තිබූ අතර, බීජ කට්ටල බෙදා හැරීමට අදාළ නාම ලේඛන මන්ත්‍රීවරුන් 13 දෙනෙකු ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන 05 ක් ලැබී ඇති අතර ඉතිරි නාම ලේඛන ලබා දෙන ලෙස මන්ත්‍රී වරුන් ලිඛිතව දැනුවත් කර ඇති බව. | නාම ලේඛණ ඉතිරි සියලු මන්ත්‍රීවරුන් ගෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලබා දෙන ලද වගකීම් කාලය තුළ දැවීගිය විදුලි පහන් 423ක් වෙනුවට නව විදුලි පහන් මිලදී ගනු ලැබූ ආයතන 03කින් ආපසු ලබා ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | විදුලි පහන් 423 ලබා දෙන ලෙසට අදාළ ආයතනයට සිහි කැඳවීම් යවා ඇති බව. | වගකීම් කාලය සහිත විදුලි පහන් සභාවට ආපසු ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 හා 2022 වර්ෂවල සභාවට අයත් මාර්ග හා වෙනත් කටයුතු සඳහා මෝටර් ග්‍රේඩරය හා බැකෝ ලෝඩරය යොදවා ගැනීමේදී මීටර් පැය 2483ක් වෙනුවෙන් ඉන්ධන ලීටර් 23,585ක් සඳහා රු.3,548,088ක් වැය කර තිබුණු නමුත් මෝටර් ග්‍රේඩර් කරන ලද මාර්ග හා බැකෝ ලෝඩරය භාවිතයෙන් කරන ලද කාර්යයන් සඳහා ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | ඉදිරියේ දී ඇස්තමේන්තු සකස් කර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සේවයේ යොදවන බව. | මෝටර් ග්‍රේඩරය හා බැකෝ ලෝඩරය සේවයේ යෙදවීමේ දී ඇස්තමේන්තු සකස් කර අදාල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සේවයේ යෙදවිය යුතුය. |
| (ඈ) | ප්‍රමිතියෙන් තොර බවට තහවුරු වූ කෝලාස් බැරල් 05ක් භාවිතයට ගෙන ඒ සඳහා රු.73,750ක් සැපයුම්කාර ආයතනය වෙත ගෙවීම් සිදු කර තිබුණි. | පාවිච්චියට ගන්නා ලද කෝලාස් බැරල් සඳහා ගෙවීම් කිරීමේ අනුමැතිය මුදල් කමිටුව ලබා දුන් පසු ගෙවීම් කටයුතු සිදු කළ බව. | අමුද්‍රව්‍ය භාවිතා කිරිමේදී ඒවායේ ප්‍රමිතිය පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කල යුතුය. |
| (ඉ) | 2021 ජූලි 08 දිනැති හා අංක 2235/54 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 26(5) වන රෙගුලාසිය අනුව රෙගුලාසි 24, 25(2), 26(1), 26(3) සහ 26(4)හි සඳහන් තැන්පතුවලින් එකතු කරන ලද අරමුදල් අදාළ නාගරික ප්‍රදේශය තුළ ප්‍රජා, විනෝද සහ එළිමහන් අවකාශ හා පහසුකම් සැපයීම සඳහා පමණක් භාවිතා කළ යුතු බව දක්වා ඇතත් සභාව විසින් රු.9,418,407ක වටිනාකමෙන් යුතු මුදල් එම අරමුණ සඳහාම යොදාවා නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන එවැනි ගිණුමක් පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන බව. | නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | සෝගාතකාගාරයක් ඉදිකිරීම සඳහා 2002 වර්ෂයේදී පුද්ගලයින් 04 දෙනෙකු වෙත ලබාදුන් රු.450,000ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. මෙම මුදල අදාල කර්තව්‍යයට සම්බන්ධ නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස 2016 ඔක්තෝබර් 13 දින පළාත් ගිණුම්කාරක සභාව මගින් උපදෙස් ලබාදී තිබුණද මේ දක්වා ඒවා අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සෝගාතකාගාරයක් ඉදිකිරීම සඳහා 2002 වර්ෂයේදී මුදල් ලබා ගත් පුද්ගලයින් 04 දෙනා සම්බන්ධයෙන් වූ නඩු විභාග වෙමින් පවතින බව. | අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | දීර්ඝ කාලීනව භුක්ති විඳිනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති අක්කර 12 රූඩ් 02 පර්චස් 23.81ක ප්‍රමාණයක් වූ ඉඩම් 35ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ඉඩම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තියට අනුව සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 03 වන වගන්තියේ කාර්යය සඳහා සෑම ප්‍රාදේශීය සභාවක්ම තම සීමා ඇතුළත නිසි බලධාරියා වුවත් බල ප්‍රදේශයට අයත් සේ සැලකෙන සුසාන භූමි 15ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන බව. | බල ප්‍රදේශයට අයත් සේ සැලකෙන සුසාන භූමි 15ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ රු.4,563,344ක් වැය කර වායු සමීකරණ යන්ත්‍ර 8ක් සවි කර තිබූ අතර ඒ සඳහා ලංසු කැඳවීමේදී එම ලංසු කැඳවීම් ලේඛනවල පිරිවිතර දක්වා නොතිබීම හේතුවෙන් විවිධ මාදිලියේ වායු සමීකරණ යන්ත්‍ර සඳහා මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි. | එක් සැපයුම්කාර ආයතනයකින් ලබාගත් මිල ගණන් කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් සමඟ සංසන්දනය කර බලා අදාළ ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා වැඩ විෂයයන් ඉටු කරවා ගත් බව. | ලංසු කැඳවීම් ලේඛනවල විවිධ මාදිලියේ වායු සමීකරණ යන්ත්‍ර සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකි වන පරිදි ලංසු කැඳවීමේ ලේඛන පිළියෙල කල යුතු ය. |
| (ආ) | සභාව විසින් මිල ගණන් කැඳවීමේදී ලංසු ලේඛනවල භාණ්ඩ සම්බන්ධයෙන් ප්‍රමාණවත් විස්තර (INVERTER TYPE යන්න පමණක් සඳහන් කර) සඳහන් නොකර ලංසු ලේඛන සකස් කිරීම හේතුවෙන් තෝරාගත් සැපයුම්කරු විසින් INVERTER වර්ගයේ වායු සමීකරණ යන්ත්‍රවල විවිධ වර්ග ඇති බැවින් එක් වර්ගයක වායු සමීකරණ යන්ත්‍ර සවි නොකර INVERTER වර්ගයේ විවිධ වායු සමීකරණ සවිකර තිබුණි. | වයඹ පළාත් ප්‍රධාන කාර්යාලය මඟින් නිකුත් කරන ලද මිල ගණන් ලේඛනය ඇස්තමේන්තුව සඳහා එලෙසම භාවිතා කර ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත මිල ගණන් පත්‍ර ලබා දුන් බව. | ලංසු කැඳවීමේ දී ලංසු ලේඛනවල භාණ්ඩ සම්බන්ධයෙන් ප්‍රමාණවත් විස්තර සඳහන් කර ලංසු ලේඛන සකස් කිරීම සිදු කල යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සේවකයින් 56ක ඌනතාවයක්ද, සේවකයින් 26ක අතිරික්තයක්ද විය. | අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලීම් කර ඇතත් මේ දක්වා පිළිතුරු ලැබී නොමැති බව. | අදාළ පුරප්පාඩු විධිමත් පරිදි සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගිය සේවකයින් 33 දෙනෙකුගෙන් සේවක ණය ලෙස රු.589,454ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. | සේවය හැර ගිය අයගේ ණය අයකර ගත නොහැකි බව හා ඉතිරි ශේෂ ඉදිරියේදී අය කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා මු.රෙ.133(1) අනුව අභ්‍යන්තර විගණනය, ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් වු නමුත් සභාවේ අභ්‍යන්තර විගණනය විසින් අවධානය යොමු කර තිබුණේ වවුචර්, නිවාඩු හා කර්මාන්ත අංශයේ ලිපිගොනු පරීක්ෂාව පිළිබඳව පමණි. | 2022 වර්ෂය තුල අභ්‍යන්තර විගණනයේ පැවති දුර්වලතා මග හරවා ගනිමින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කරමින් කටයුතු කරන බව. | ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය ශීර්ෂ 106කට අදාළව රු. 34,240,834ක් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම සම්පූර්ණ ප්‍රතිපාදනයම අදාළ අරමුණු ලඟා කර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | ඉදිරිපත් කර ඇති කරුණු සමග එකග වන බව. | ඇස්තමේන්තු සකස් කිරීමේදී වඩාත් තාත්වික ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරිසර සංවර්ධන අරමුණු 07ක් ඉටු කිරීම සඳහා අවධානය යොමු කර තිබුණු අතර ඒ සඳහා 2022 වර්ෂයේ රු.69,885,469ක් වැයකර තිබුණි. | ඉදිරිපත් කර ඇති කරුණු සමග එකග වන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කල යුතුය. |